**බෙන්තොට ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජුනි 14 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ මෝටර් රථ හා කරත්ත අළුත්වැඩියා වියදම් රු.225,214 ක් ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | ඉදිකිරීමට යෝජිත හබුරුගල ගොඩනැගිලි සංකීර්ණය වෙනුවෙන් සභා දායකත්වය ලෙස පළාත් පාලන දෙපාර්තමේන්තුවට ලබාදෙන ලද රු.10,000,000 ක්, අත්තිකාරම් ලෙස නොදක්වා රු.2,300,000 ක් ප්‍රාග්ධන වියදම් ලෙසත් හා රු.7,700,000 ක් ණයගැතියන් ලෙස දක්වා රු.10,000,000 ක් ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත උසාවි දඩ රු.1,040,347 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි තොරතුරු ලබාගෙන නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් රු.4,713,199 ක් වෙනුවෙන් සහ විගණන ගාස්තු වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ)** **නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 06 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.32,984,736 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | කාලයක සිට පවතින අසමාන -තාවයන් බැවින් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.140,240,670 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(i) **ලැබිය යුතු ගිණුම්**

| විස්තරය | මුදල රු. | අය නොවී පවතින කාලය අවු: | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| ලැබිය යුතු මුද්දර ගාස්තු | 16,379,501 | 03 සිට 10 | ලැබිය යුතු ගිණුම් ශේෂ අයකර ගතයුතු වේ. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. |
| ලැබිය යුතු කර්මාන්ත ආධාර | 2,701,046 | 04 සිට 07 | ලැබිය යුතු ගිණුම් ශේෂ අයකර ගතයුතු වේ. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. |
| පෙර ගෙවුම් | 159,278 | 04 සිට 15 | ලැබිය යුතු ගිණුම් ශේෂ අයකර ගතයුතු වේ. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| වැටුප් ප්‍රතිපූර්ණ | 104,000 | 09 සිට | ලැබිය යුතු ගිණුම් ශේෂ අයකර ගතයුතු වේ. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. |

(ii) **ගෙවිය යුතු ගිණුම්**

---------------------

| | | | |
|---|---|---|---|
| * | 2016 වර්ෂයට පෙර සිට පැවත එන රු.6,890,074 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂයන් සහ 1991 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා රු.859,446 ක් වූ වියදම් ණයහිමි ශේෂයන් 07 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළයුතු වේ. | ඉදිරියේ දී ගෙවීම් කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම්

-------------------

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියා ගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|---|---|
| **(අ)** | **1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති**217 හා 218 | - | සභාව සතු සියළු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් කර නොතිබුණු අතර, අංක පී.එස්.46 දරන ආකෘතිය ප්‍රකාර ලේඛනයක් ද පවත්වා නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |
| **(ආ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 1,304,717 | වසර 02 ට වැඩි කාලයක් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

# 2 මූල්‍ය සමාලෝචනය

----------------------

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.14,009,586 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.15,949,889 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂය අවසානයට මුදල් මාරු කිරීම් ගිණුමේ හර හා බැර ශේෂ එකිනෙකට සමාන වී ගිණුම තුලනය වියයුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල රු.73,102 ක හර ශේෂයක් දැක්වුණි. | නිසි පරිදි ගිණුම් තැබීම සිදුකර ගිණුම පියවිය යුතුය. | ඡේදයෙන් දක්වා ඇති තත්ත්වය පිළිගනී. ඉදිරියේ දී නිවැරදි කරමි. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තු ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු කුලී | 22,123,117 | 18,156,859 | 18,283,719 | 10,121,943 | 13,667,900 | 23,956,022 | 17,277,023 | 10,125,943 |
| | 1,270,000 | 528,560 | 1,038,522 | 50,050 | 1,562,000 | 1,018,700 | 985,862 | 102,883 |
| බලපත්‍ර ගාස්තු | 626,500 | 635,150 | 727,350 | 18,250 | 897,500 | 874,135 | 930,235 | 43,225 |
| සේවා සඳහා ගාස්තු | 4,189,000 | 321,807 | 3,589,932 | 5,040 | 4,629,900 | 4,654,646 | 4,654,646 | 1,040 |
| | 28,208,617 | 19,642,376 | 23,639,523 | 10,195,283 | 20,757,300 | 30,503,503 | 23,847,766 | 10,273,091 |

### 2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ අයවිය යුතු මුළු ආදායම රු.29,915,467 ක් වුවද, රැස්කළ ආදායම රු.23,638,523 ක් වීමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.10,195,283 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.933,812 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.35,398,665 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථාව අනුව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වේ. | 2019 වර්ෂයට ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කරමි. |

**(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ එකතු වන කසළ සභාව සතු ජම්බුගහපිටිය වත්ත ක්‍රීඩාංගනයට බැහැර කරනු ලබන අතර, මෙම ඉඩම සංචාරක පුරවරයට හා නගර ආසන්නයේ පිහිටි ජනාකීර්ණ ප්‍රදේශයක් බැවින් කසළවලින් හමන අධික දුගඳ සහ මැසි මදුරු උවදුරින් ජනතාව පීඩා විඳිමින් පැවතුණි.<br><br>එමෙන්ම 2017 අප්‍රේල් 20 දිනැති අංක 2015/53 දරන ගැසට් නිවේදනයේ මාර්ගෝපදේශය අනුව | දීර්ඝකාලීන වැඩපිළිවෙලක් සකස් කර, ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත් කළ යුතු වේ. | ඉඩමක් ලබා ගැනීමෙන් පසුව දීර්ඝකාලීන වැඩපිළිවෙලක් සකස් කරමි. |

දීර්ඝකාලීන වැඩපිළිවෙලක් පිළියෙල කර නොතිබුණි.

**(ඇ) තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටුකර ගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සඳහා වන දීර්ඝකාලීන සැලසුම් සකස් කර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවිය යුතු වේ. | බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට ඉදිරියේ දී සැලැස්මක් සකස් කරමි. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත සංඛ්‍යාව ඉක්මවූ අතිරික්ත සේවක සංඛ්‍යාව 05 ක් වූ අතර, පුරප්පාඩු සංඛ්‍යාව 11 ක් විය. අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් කර ගැනීමට මෙන්ම, පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | පුරප්පාඩු විධිමත්ව බඳවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පුරප්පාඩු සඳහා අනුමැතියට යවා ඇත. |
| (ආ) | විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා මිය ගිය නිලධාරීන් 29 දෙනෙකුගෙන් අයවිය යුතු රු.239,416 ක සේවක ණය මුදලක් දීර්ඝ කාලයක් තිස්සේ අය කරගෙන නොතිබුණි. | අය නොවන සේවක ණය අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. |

**3.3 වත්කම් කළමනාකරණය**

**3.3.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභා කැබ් රථයක එන්ජිම සම්පූර්ණ අළුත්වැඩියාව සඳහා රු.802,884 ක් වැයකර තිබුණ ද, වසරක වගකීම් කාලයට පෙර එන්ජිම අක්‍රීය තත්ත්වයට පත්ව තිබුණි. රියදුරන්ට ලබාදුන් උපදෙස් පිළි නොපැදීම | මූලික විමර්ශනයක් සිදුකර, වගකිව යුතු පුද්ගලයන් හඳුනාගෙන අලාභයන් අයකර ගැනීමට කටයුතු කළ | පළාත් පාලන දෙපාර්තමේන්තුව හරහා මූලික විමර්ශනයක් සිදුවෙමින් පවතී. |

| | | |
|---|---|---|
| නිසා මෙහි වගකීම භාරගත නොහැකි බව අළුත්වැඩියා ආයතනය සභාවට දන්වා තිබූ අතර, නැවත අළුත්වැඩියාව සඳහා වාහන නියෝජිත ආයතනය මඟින් රු.2,682,755 ක ඇස්තමේන්තුවක් ලබාගෙන තිබුණි.මේ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පැවැත්විය යුතු බවට යාන්ත්‍රික ඉංජිනේරුවරයා 2018 අප්‍රේල් 05 ලිපියක් මඟින් දැනුම් දී තිබුණ ද, 2019 පෙබරවාරි 15 දින දක්වා මූලික විමර්ශනයක් සිදුකර නොතිබුණි. | යුතු වේ. | |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

---------------------------------------

### 4.1 අයවැය පාලනය

------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අරමුණුගත කාර්යය සඳහා යොදවා නොගැනීම නිසා එක් වැය විෂයයක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ.<br>තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී ඉලක්ක වියදම් ළඟාකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | ආදායම් විෂයයන් 02 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු.5,870,079 ක් වූ අතර, එය සියයට 21 සිට සියයට 99 දක්වා පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී ඉලක්ක ආදායම් ළඟාකර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | වියදම් විෂයයන් 04 ක එකතුව රු.16,629,664 ක් වූ ඉතිරිවීම් තිබූ අතර, එය සියයට 23 සිට සියයට 65 අතර පරාසයක විය. | | ඉදිරි වර්ෂයේ දී ඉලක්ක වියදම් ළඟාකර ගැනීමට කටයුතු කරමි. |

### 4.2 අභ්‍යන්තර විගණනය

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/නා.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණු අතර, අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා එවීමට කටයුතු කරමි. |